**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල**

**විෂය - නාට්‍ය හා රංග කලාව**

**9 ශ්‍රේණිය**

02 වන වාරය, ජුලි 02 වන සතිය

**සැකසුම -එස්.එස්.සී.ජයසූරිය**

**1. නිපුණතාව 4.0:** නාට්‍ය හා රංග කලාව විෂයට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 4.1:** දේශීය නාට්‍ය කලාවේ ඉතිහාසය හා සබැඳි නාට්‍යයේ අංකුර අවස්ථා අධ්‍යයනය කර එහි ඇති ප්‍රාසාංගික ලක්ෂණ හඳුනා ගනියි.

**පාඩම :** දේශීය නාට්‍යය කලාවේ ඉතිහාසය හා බැඳි නාට්‍යමය අංකුර අවස්ථා අධ්‍යයනය

## 2. ශිෂ්‍යයා විසින් කල යුතු කාර්යයන්:

- දේශීය නාට්‍ය කලාවේ ඉතිහාසය හඳුනා ගැනීම.
- දේශීය නාට්‍ය කලාවේ ඉතිහාසය හා බැඳි නාට්‍යමය අංකුර හඳුනා ගැනීම.
- මිලින්ද ප්‍රශ්නය සම්බන්ධයෙන් තොරතුරු එක් රැස් කිරීම.

- පහත දී ඇති ඉගෙනුම් පත්‍රිකා හා අනෙකුත් ඉගෙනුම් ආධාරක ඇසුරෙන් දි ඇති ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන්න.

- පාසල ආරම්භයේදී ඔබගේ අනාවරණයන් පන්තිය ඉදිරියේ ඉදිරිපත් කරන්න.

**3.ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි පොත්පත, කියවීම් පත්‍රිකා, Websites සහ ඉගෙනුම් ආධාරක :-**

- **eතක්සලාව -**
  https://www.e-thaksalawa.moe.gov.lk/web/en/

- **eනැණපියස -**
  course : 09 ශ්‍රේණිය නාට්‍ය හා රංගකලාව
  https://enenapiyasa.lk/

- **You Tube-**
  **මිලින්දප්‍රශ්නය**
  https://youtu.be/Wp5diEe__B4

- **කියවීම් පත්‍රිකාව -**

මිලින්ද ප්‍රශ්නය.

මෙහි දී නාගසේන හිමියන්ගෙන් මිලිදු රජු ප්‍රශ්නය පිළිබඳ ව ඉදිරිපත් කෙරේ.

උදා:- මිලිදු රජු - ස්වාමීනි ඔබ වහන්සේ කවර නම් වීද?
නාගසේන හිමි - මහරජතුමනි මම නාගසේන වෙමි.
මිලිදු රජු - නාගසේන වූයේ කවරෙක් ද? හිසකේ නාගසේන ද?
නාගසේන හිමි - නැත මහරජ
මිලිදු රජු - එසේනම් නියපොතු, දත්, සම්, මස්, නහර ආදිය නාගසේන ද?
නාගසේන හිමි - නැත මහරජ
මිලිදු රජු - එසේනම් රූපය වේදනාව ආදිය නාගසේන ද?
නාගසේන හිමි - නැත මහරජ
මිලිදු රජු - එසේනම් ස්වාමීනී නාගසේන කෙනෙක් නැත
නාගසේන හිමි - මහරජ කිමෙක් ද තෙපි පයින්ද අයේ ද?
මිලිදු රජු - සවාමීනි මම රථයෙන් ආමි....

මෙසේ දීර්ඝ ව සාකච්ඡාවක නිරත වීම සිදුවේ. මේ තුළ දැකිය හැකි නාට්‍යයමය අංකුර අවස්ථා ගණනාවකි.

- අනුකරණය - ගිහියෙක් රජු ලෙස ඉදිරිපත් කිරීම් කිරීම.
- සමාරෝපය - ගිහියෙක් රාජාභරණ හා කිරුළ පැළඳ මිලිදු රජු ලෙස සැරසීම.
- සංවාද භාවිතය (මිලිදු රජු හා භික්ෂුව අතර සංවාදය)
- වේශභූෂණ - මිලිදු රජුගේ රාජ ඇඳුම්
- අංග රචනය - මිලිදු රජු ලෙස මුහුණ සකස් කිරීම.
- අලෝකය භාවිතය - පන්දම් භාවිතය
- ප්‍රේක්ෂකයා (උපාසක උපාසකයන්)
- සංගීතය (විවිධ ශබ්ද භාවිතා කිරීම)
- නළු නිළියන් (මිලිදු රජු ලෙස සැරසුන උපාසකයන්)

මෙසේ නාට්‍යමය අංකුර අවස්ථා ගණනාවක් මිලින්ද ප්‍රශ්නය තුළ දැකිය හැකි ය.

**4.මෙම සතියට නියමිත පාඩම මඟින් ආවරණය විය යුතු ඉගෙනුම් ඵල:**

- නාට්‍ය කලාවේ ඉතිහාසය හඳුනා ගැනීම.
- නාට්‍ය කලාවේ ඉතිහාසය හා බැඳි නාට්‍යමය අංකුර හඳුනා ගැනීම.
- මිලින්ද ප්‍රශ්න නම් නාට්‍යමය අවස්ථාවේ දැකිය හැකි නාට්‍යමය ලක්ෂණ හඳුනා ගැනීම.

**5.ඇගයීම /තක්සේරුකරණ ක්‍රමවේදය හා ආකෘති:**

1. මෙම බෞද්ධ පූජා කර්මයට අයත් චරිත දෙකක් ලියා දක්වන්න.
2. මිලින්ද ප්‍රශ්නය නැමති බෞද්ධ පූජා කර්මය කෙටියෙන් විස්තර කරන්න.
3. මෙහි ඇතුළත් නාට්‍යම අවස්ථා උදාහරණ සහිතව ලියා දක්වන්න.

සැකසුම :- S.S.C ජයසූරිය

ර/නිවි/සිංහලගොඩ විද්‍යාලය